# 1848 නිදහස් අරගලයට බල පෑ හේතු සාධක සහ එහි ප්‍රතිඵල පිළිබඳ විමසීමක්

**වටරක්ගොඩ සුමන හිමි**

ශ්‍රී ලංකා ඉතිහාසයේ 1819 සිට 1848 දක්වා වූ වසර තිහක කාලය තුළ 1820, 1823, 1824, 1834 සහ 1842 වසරවලදී ආණ්ඩු විරෝධී අරගල හයක් ඇති වී තිබේ.[1] එකී සටන් ව්‍යාපාර බ්‍රිතාන්‍යයන් විසින් ඉතා පහසුවෙන් මර්දනය කරන ලදී. එම සටන් ව්‍යාපාර අතරින් 1842-43 ඇති කළ සටන් ව්‍යාපාරයට හැර අනෙකුත් සටන් ව්‍යාපාර සියල්ලටම නායකත්වය දෙමින් දායක වූවේ උඩරැටියන් ය. එහෙත් 1842-43 සටන් ව්‍යාපාරයට නායකත්වය ගෙන ඇත්තේ පහතරටින් උඩරටට සංක්‍රමණය වූවන්ය. 1848 අරගලය සඳහා මූලිකත්වය ගන්නේ ද ඔවුන් ම ය. එයට ප්‍රධාන හේතුන් වන්නේ බ්‍රිතන්‍යයන්ට විරුද්ධව නායකත්වය ගැනීම සඳහා උඩරට සිටි නායකයන් බ්‍රිතාන්‍යයන් විසින් විනාශ කොට තිබීමත්, 1818 ආඥාව මගින් පාරම්පරික නායකත්වයත් සහ ජනතාව අතර සබැඳියාව අහෝසි කර දැමීමත් ය.[2] එසේම උඩරට පහතරට යා කරමින් මාර්ග පද්ධතිය වැඩි දියුණුකර තිබීම පදනම් කරගනිමින් පහතරැටියන් විවිධ කාරණාවන් සඳහා උඩරටට සංක්‍රමණය වූහ. වසර තුන්සියයකට වැඩි කාලයක් පුරා බටහිර ජාතිකයන් සමග කටයුතු කොට පලපුරුද්දක් සහිත පහතරට වැසියාට විදේශික පාලනය අමුත්තක් නොවීය. උඩරැටියාට වඩා බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳ අවබෝධයක් පහතරැටියාට පැවති අතර පාලන වෙනස්වීම් කෙරෙහි උඩරටට සාපේක්ෂව පහතරට ඉක්මනින් සංවේදී විය. එහෙත් පාලකයන්ට එරෙහිව කටයුතු කිරීමේ සහ ස්වාධීනත්වය

දිනාගැනීමේ අභිලාසයන් අතින් උඩරට වැසියන් ඉහළ තලයක පසු වූහ. බ්‍රිතාන්‍යයන්ට එරෙහිව කටයුතු කිරීමේ දී 1798 දී වැඩි කළ බදු මුදල් වලට විරුද්ධව සිදු කළ අරගලය[3] හැරෙන්නට පහත රටියන්ට වෙනත් අත්දැකීමක් තිබුනේ නැත. එහෙත් උඩරටියන්ට ඒ හා සම්බන්ධව අවශ්‍ය පමණටත් වඩා අත්දැකීම් තිබුණි. 1848 අරගලයේ නායකත්වය ගත්තා පැලියගොඩ ඩේවිඩ්, දීනිස් සහ මොරටුවේ ෆැන්සිස් ප්‍රනාන්දු උඩ රටියන් සතු අත්දැකීම් එම ප්‍රදේශයන්හි ජීවත්වීමෙන් ලබාගෙන ඉංග්‍රීසි පාලකයන් පිළිබඳ තම අවබෝධය ද එකතු කරගනිමින් සිවිල් ජන අරගලයක් නිර්මාණය කිරීමට සමත් වන බව හඳුනාගත හැකිය.

එම කාරණාවන්ට අමතරව 1848 අරගලය නිර්මාණය වීම සඳහා බලපෑ කරුණු රැසක් පවතින බව හඳුනාගත හැකිය. එහිදී 1833 දී ඇති කළ කෝල්බෲක් කැමරන් දේශපාලන ප්‍රතිසංස්කණ කෙරෙහි විශේෂ අවධානයක් දැක්විය යුතුය.[4] ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරමින් කෝල්බෲක් ප්‍රකාශ කළේ ලාංකික ජනතාව බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව කිසි විටෙක නැගී නොසිටිනු ඇතැයි යනුවෙනි.[5] එහෙත් එම ප්‍රතිසංස්කරණ ආරම්භ කොට වසර පහළොවකට පසුව සිදු වූ ජනතා නැගීටීමෙන් පෙනෙන්නේ කෝල්බෲක්ගේ උපකල්පනය වැරදී ඇති බවයි. කෝල්බෲක් ප්‍රතිසංස්කරණයන්ගේ මූලික අරමුණ වූයේ පැවති වැඩවසම් ආර්ථික ක්‍රමය වෙනුවට ධනවාදී ආර්ථික ක්‍රමයක් ගොඩනැගීමයි. එම ක්‍රමය ගොඩ නගන අතරතුර අධික රාජ්‍ය වියදම පහත දැමීම සිදුකිරීමත් බ්‍රිතාන්‍ය අපේක්ෂාව විය. එකී අභිලාසයන් සඵල කරගැනීම සඳහා ඉදිරිපත් කළ යෝජනා ලෙස යුරෝපීන්ට මෙරටේ පදිංචියට අවසර දී ඉඩම් වගාවේ දියුණුව යෝජනා කිරීම, විදේශීන්ට ඉඩම් ලබාදීම, රාජ්‍ය සේවා ව්‍යවස්ථා දායක සභාවක් ඇති කිරීමට යෝජනා කිරීම, ජනාවාස ඇති කිරීම පිළිබඳ යෝජනා, ගම්පති ක්‍රමය හා විහාර ඉඩම්වල සේවා භුක්තිය තව දුරටත් තබාගැනීම, මෙරට දැනුම ව්‍යාප්ත කිරීම හා මුද්‍රණාල ඇති කිරීම ආදිය පෙන්වා දිය හැකිය.



මෙකී යෝජනා අතර ඉතා වැදගත් යෝජනාවක් වූයේ මෙතෙක් ස්වාධීන පරිපාලන ඒකක දෙකක් ලෙස පැවති උඩරට සහ පහත රට ප්‍රදේශ එක් පරිපාලන ව්‍යූහයකට ගෙන ඒම සඳහා කරන ලද යෝජනාවයි. උඩරට පැවති කොමසාරිස් මණ්ඩලයේ පාලනය අහෝසි කරමින් දිවයින පළාත් පහකට බෙදා කොළඹ, ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය හා නුවර යන නගරවල පරිපාලන මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජනා කළේය. මෙලෙස ලංකාවේ එතෙක් පැවති පරිපාලන ක්‍රමය ව්‍යූහාත්මකව පරිකෘතික වෙනසකට බඳුන් කිරීමට අවශ්‍ය යෝජනා ප්‍රථම වතාවට කෝල්බෲක් විසින් ඉදිරිපත් කෙරුණි. ඊට අමතරව ලංකාවේ ආදායම පිළිබඳ වාර්තාව, රාජකාරී ක්‍රමය පිළිබඳ රහස්‍ය වාර්තාව හා ලංකාවේ ආයතන සහ වැය පිළිබඳ වාර්තාව මගින් තවත් යෝජනා රැසක් ඉදිරිපත් කොට තිබේ. එකී යෝජනා අතරින් රාජකාරී ක්‍රමය අහොසි කිරීම, විශ්‍රාම වැටුප් අහෝසි කිරීම, පෞද්ගලික ව්‍යවසායකත්වය පුළුල් කිරීම, නිදහස් වෙළඳ සමාජයක් ඇතිකිරීම, වක්‍ර බදු ක්‍රම යෝජනා කිරීම, සමහර දෙපාර්තමෙන්තු අහෝසි කිරීම, අරක්කු පෙරීමේ ඒකාධිකාරය අහෝසි කිරීම, බ්‍රිතාන්‍ය ඒකාධිකාරය අහෝසි කිරීම, බ්‍රිතාන්‍ය මුදල් ක්‍රමය හඳුන්වාදීම, අධ්‍යාපනය පුළුල් කිරීම හා අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි කිරීම, ඉඩම් නීති වෙනස් කිරීම[6] ආදි යෝජනා ප්‍රමුඛ යෝජනා ලෙස පෙන්වාදිය හැකිය.

උක්ත යෝජනාවලින් පැහැදිලිවම රාජ්‍ය වියදම් අඩු කරමින් බ්‍රිතාන්‍ය ආයෝජකයන් දිරි ගන්වන ආකාරයට කටයුතු සිදුකොට තිබේ. ඒ සඳහා රජයේ ඉඩම් පුද්ගලික අයිතියට පැවරිය හැකි ආකාරයට නීති සම්පාදනය කළේය. 1840 අංක 05 දරණ පනතත්, 1840 අංක 12 දරණ මුඩු බිම් පනතත් ඒ අනුව ඉදිරිපත් කෙරිණි. එම නීති ප්‍රකාරව වගා නොකළ ඉඩම් සහ නොකඩවා වසර තිහක් පමණ භුක්ති විඳි බව තහවුරු නොකළ ඉඩම් රජයට පවරාගෙන ඉඩම් අක්කරය සිලිං පහ ගණනේ සීමා රහිත ප්‍රමාණයෙන් යුරෝපා ව්‍යවසායකයන්ට විකුණනු ලැබුවේය.[7] කලින් කලට හේන් ගොවිතැනේ නියැලෙමින් ගවයන්ට තණ කවා ගනිමින් එදනෙදා දිවි පැවැත්මට අවශ්‍ය දර, අල, පලා

ආදිය ලබාගත් ඉඩම් අක්කර සිය ගණනින් බ්‍රිතාන්‍ය පාලනයට නතු වීම, විශේෂයෙන් උඩරට ජනයාගේ ජීවන ක්‍රමයට විශාල බලපෑමක් කළේය. සාම්ප්‍රදායිකව පැවති රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හේතුවෙන් ගැමි ජනතාවගේ ජීවන ක්‍රමය විපරීත වූ අතර ඒ සඳහා කිසිදු විකල්පයක් ඉංග්‍රීසීන් විසින් ඉදිරිපත් නොකිරීම ජන ජීවිතය අවුලෙන් අවුලට පත් කිරීමක් විය. රාජකාරි ක්‍රමය අහෝසි කිරීමෙන් ඉංග්‍රීසීන් බලාපොරොත්තු වූයේ තම අනාගත ව්‍යාපෘති සඳහා ශ්‍රමය නිදහසේ ලබා ගැනිමටයි. එහෙත් ලාංකික ගැමියා එයට යොමුකර ගැනීමට නොහැකි වීම නිසා දකුණු ඉන්දියාවෙන් ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමට සිදුවිය.

ශ්‍රී ලංකා රාජ්‍යයේ නිසි බලධරයා ලෙස බ්‍රිතාන්‍යය, ලක් වැසියන්ගේ අභිවෘධිය සඳහා ක්‍රියා මාර්ග අනුමනය කළ බවක් නොපෙනේ. මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ කෘෂි කර්මාන්තය දියුණු කිරීම සඳහාවත් කිසිදු වැඩ පිළිවෙළක් රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මකව නොතිබුණි. තත්කාලීන වාර්තා නිරීක්‍ෂණය කරන විට එය මැනවින් තහවුරු වේ. එච්. වයිට්ගේ වාර්තාවන්ගෙන් බ්‍රිතාන්‍ය පාලනය යටතේ වාරිමාර්ග රාශියක් විනාශ වී ඇති හෙයින් අතහැර දමා ඇති බවත් බදුල්ලේ අක්කර හයදහසක් පමණ වූ ගොවි බිම්වලින් වැඩි හරියක් ම ජල පහසුව නැතිකමින් අවුරුදු දෙකේ සිට හත දක්වා කලයක් තුළ වගා නොකරන ලද බවත් මෙම තත්ත්වයන් මගහැරවීමට රජය කිසිදු පියවරක් ගෙන නොමැති බවත් පෙන්වා දී තිබේ.[8] 1818 අරගලය මර්දනය කිරීමේ දී වැව් රාශියක් විනාශයට පත්කොට තිබූ[9] අතර තරුණයන් දස දහසක් පමණ අරගලයෙන් මරාදැමුණු හෙයින්[10] වැව් අමුණු ගොඩනැගීමට කෙනෙකු නොමැති නිසා ඌව පළාතේ වෙල් යායවල් පුරන් වී තිබුණි. වියලි කලාපයේ ද පැවතියේ මෙබඳුම තත්ත්වයක් බව "රට ශීඝ්‍රයෙන් ජන ශූන්‍ය බවට පත් වෙයි. ඇසට හමුවන දර්ශනයන් බියකරුය. මේ තත්ත්වය නැති කිරීමට නම් විශාල වාරි මාර්ග ක්‍රම ක්‍රියාත්මක කිරීමට රජය විධි විධාන යෙදිය යුතුය."[11] යනුවෙන් මේජර් ස්කිනර් කරන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.



කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ලංකාව ප්‍රධාන පරිපාලන ඒකක පහකට බෙදා දිසාපතිවරුන් පස් දෙනෙකුගේ පාලනය යටතට පත් කෙරුණි. පරිපාලන ප්‍රදේශය ඉතා විශාල බැවින් ජනතාව සහ නිලධාරීන් අතර පැවතියේ දුරස්ථ සබඳතාවකි. ජනතාවගේ ඕනෑ එපාකම් පිළිබඳ සවිඥානික බවක් නිලධාරීන්ට නොවීය. රට වැසියා පිළිබඳව සෙවීමට වඩා වෙනත් දෑ කෙරෙහි අවධානය යොමු කිරීමට නිලධාරීන්ට සිදුව තිබූ බව පෙනේ. නිලධාරීන්ගේ වැටුප අඩු කොට විශ්‍රාම වැටුප අහෝසි කර ඒ වෙනුවට ආදායම් උපයා ගැනීමට වතු වාගාව කෙරෙහි යොමු වීමට උනන්දු කිරීම සහ ආර්ථිකමය වශයෙන් ලාභදායී ව්‍යාපාරයන්හි නිරත වීමට අවස්ථාව සලසා දීම රාජ්‍ය වගකීම් කෙරෙන් නිලධාරීන් දුරස් කිරීමට හේතුවිය. රාජ්‍ය නිලධාරීන් සහ වැසියන් අතර පැවති සබඳතාවයේ තරම හිටපු යටත් විජිත ලේකම්වරයෙකු වූ ඇන්ස්තෘ ද මහතාගේ ප්‍රකාශයක් වන "ලංකාවේ පාලකයන් සහ පාලිතයන් තිරයකින් මෙන් සම්පූර්ණයෙන්ම ඔවුනොවුන් වෙන්කොට සිටිති. රාජ්‍ය සම්බන්ධතාවන් පවත්වන කිසිවෙක් වැසියන්ගේ භාෂාව නොදත්හ. ඔවුන්ගේ සිරිත් විරිත් ගැන දන්නේ ඉතාමත් ටික දෙනෙකි. කොටින්ම ඔවූහු වැසියන් ගැන කිසිත් නොදනිති''[12] යන්නෙන් කදිමට පැහැදිලි වේ.

1848 වසර ආසන්න සමය වන විට කෝල්බෲක් ප්‍රතිසංස්කරණයන් මගින් නිර්මාණය කරන ලද අසංතෘප්ත සමාජ වටපිටාවේ ස්වභාවයයි පූර්වයෙන් මතුකොට ඇත්තේ. ව්‍යවස්ථා දායක සභාව සහ විධායක සභාව ඇති කරමින් ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කරන ලද බව ප්‍රකාශ කළ ද එය හුදු ප්‍රකාශනයක් පමණක් බව උක්ත තත්ත්වයන් හා සැසඳීමේ දී පැහැදිලිව හඳුනාගත හැකිය. සාමාන්‍ය ජනයාට පහසුකම් නොසපයන බ්‍රිතාන්‍ය අභිලාසයන් පමණක් පූරණය කරන එකී ප්‍රතිසංකරණ මගින් ව්‍යුහාත්මක වශයෙන් නවීන පාලන ක්‍රම නිර්දේශ කළත් ඒවා ලංකාවේ භූමිය හා නොගැලපුණු ක්‍රමවේද බව 1848 අරගලයෙන් පෙන්වා දෙනු ලැබීය. කෙසේ නමුත් මෙරට මුද්‍රණාල ඇතිකරමින් දැනුම

ව්‍යාප්ත කිරීමට ප්‍රතිසංස්කරණ මගින් සිදු කොට තිබූ යෝජනාව ක්‍රියාත්මක වීම 1848 අරලයට අවශ්‍ය දැනුවත් කිරීම සහ මතවාදීමය වශයෙන් අවශ්‍ය මග පෙන්වා දීම් සිදු කිරීම සඳහා බොහෝ සෙයින් ඉවහල් වීය. මෙසේ 1833 දී ගෙන එන ලද දේශපාලන ප්‍රතිසංස්කරණ විසින් නිර්මාණය කරන ලද සමාජ වටපිටාව 1848 ජනතා නැගිටීමට බලපාන ලද දීර්ඝකාලීන හේතු ලෙස හඳුනාගත හැකිය.

උක්ත කාරණාවන්ට අමතරව අරක්කු පෙරීමේ ඒකාධිකාරය අහෝසි කොට වෙළඳ ව්‍යාපාරිකයන්ට අරක්කු රේන්ද ලබාදී ලංකාව පුරා තැබෑරුම් විවෘත කරමින් මත්පැන් සඳහා රාජ්‍ය අනුග්‍රහය යටතේ ජනයා පෙළඹවීම පෙර නොවූ විරූ සමාජ ව්‍යසනයකට මං පෑදීමක් විය. 1815 පටන්ම පාලන උපක්‍රමයක් ලෙස ඉංග්‍රීසීන් උඩරට ප්‍රභූන් වෙත මත්පැන් ලබා දීම රහසිගතව සිදු කොට තිබේ. එහෙත් එය සමාජයේ නීත්‍යනුකූල දෙයක් ලෙස ප්‍රචලිත වීම ජාතිමාමක ලාංකිකයන්ගේ විරෝධයට හේතු විය. 1842-43 සමයේ සංවිධානය වන අරගලයට මූල කාරණා වන්නේ තත්කාලීනව නිර්මාණය වී තිබූ මෙම වටපිටාවයි. ඉතා සුලු පිරිසක් පමණක් සම්බන්ධ වූ එම අරගලය ඉතා පහසුවෙන් පාලනය කිරීමෙන් පසුව 1848 දී විශාල ජන සහභාගීත්වයක් සහිතව බ්‍රිතාන්‍යයන්ට එරෙහිව නැගී සිටීමට සමීප හේතු කිහිපයකුත් බලපා ඇති ආකාරය නිරීක්ෂණය හැකිය. අන්තර්ජාතික වාණිජ ප්‍රවාහයේ ලංකාවෙන් අපනයනය කරන වාණිජ භාණ්ඩයන්හි මිල අගය පහත වැටුණි. එයින් රජයට වන පාඩුව පියවා ගැනීම යෝජිත පිළිතුර වූයේ ජනතාවගෙන් බදු මුදල් අය කිරීමයි. ඒ යටතේ එවකට අණ්ඩුකාරවරයාව සිටි ටොරින්ටන් සාමි විසින් බදු වර්ග හතක් පනවන ලදි. මුද්දර බද්ද, කරත්ත බද්ද, බෝට්ටු බද්ද, සාප්පු බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද, බලු බද්ද යනු එම බදු වර්ග හතයි. මෙම බදු වලින් මුද්දර බද්ද මීට පෙරත් ඔප්පු තිරප්පු වලංගුවීම සඳහාත් නඩු ඉදිරිපත් කිරීමේදීත් මුදල් ගනුදෙනු වලංගු වීම සඳහාත් ඒ ඒ වටිනාකම් සහිත මුද්දර ඇලවිය යුතු විය.[13] 1831 දී අධිකරණ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළ කැමරන් කියා සිටියේ මුද්දර ගාස්තුව නිසා නඩු



කියන්නන් හට මහත් දුෂ්කරතාවයකට මුහුණපාන්නට වන නිසා එය අහෝසි කළ යුතු බවය.[14] එහෙත් සිදුවන්නේ මුද්දර බද්ද වැඩි කරමින් තවදුරටත් ව්‍යාප්ත කිරීමයි.

අනෙකුත් බදු වර්ග සියල්ල ද ජනතාව පීඩාවට පත් කරන ඒවා විය. එබදු බදු ගෙවීම් ගැන පුරුද්දක් හෝ දැනුවත් භාවයක් ජනතාවට නොවීය. රටේ ප්‍රවාහනය සම්පූර්ණයෙන්ම රදා පැවතියේ කරත්ත හා ඔරු පාරු පදනම් කොට ගනිමිනි. එහෙත් ඒවා මහා පරිමාණ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක නොවුණි. එනිසා ඒවායේ අයිති කරුවන්ට විශාල ලාභයක් නොලැබුනු අතර නියම කරන බදු ගෙවීම පහසු කටයුත්තක් නොවීය. සාප්පු බද්ද යටතේ සෑම කඩ හිමියෙකුටම පවුම් පහක වාර්ෂික ආදායමක් ඇත්නම් පවුමක බද්දක් ගෙවිය යුතු යැයි නියම කිරීමෙන් වඩාත් අපහසුවට පත් වූයේ පිටිසර පළාත්වල කුඩා කඩ පවත්වාගෙන ගිය ගැමියා ය. හේන, කුඹුර වන සතුන්ගෙන් රැකගැනීමට පාවිච්චි කළ තුවක්කුවට අය කළ බද්ද ඇතැම් විට තුවක්කුවටත් වඩා වැඩි විය. එය ගෙවීමට සැතපුම් තිහ හතලිහ ගෙවා කච්චේරියට යෑමට සිදු විය. ඉංග්‍රීසියෙන් පිළියෙල වූ බලපත්‍ර පිරවීමට ලියන්නන්ට අල්ලස් ගෙවීමට ද සිදු විය.[15]

මේ සියල්ලෙන්ම සිදු වූයේ ගැමියා පීඩාවට පත්වීමයි. බදු අයකරන්නට කිසිවක් නොමැති තැන අයකරන ලද බද්දක් ලෙස බලු බද්ද ජනයා විසින් සලකන ලදී. එසේම එය තමන්ට කරන ලද නින්දාවක් ලෙස ද ඇතමුන් සලකා තිබේ. ඒ බව "අපේ ධාන්‍යවලට ගෙවල්වලට කරත්තවලට බදු අය කරන්න. නමුත් පර බල්ලන්ටත් බදු ගෙවීමට නියම කිරීමෙන් අපට නින්දා නොකරන්න"[16] යන ප්‍රකාශනයෙන් පැහැදිලි වේ. එකල සෑම නිවසකම පාහේ බල්ලන් සිටිය ද ඔවුන්ට නියම අයිතිකාරයන් නොවීය. මෙම බද්ද සම්බන්ධයෙන් පොලිසිය වාර්තා කොට ඇත්තේ "ආහාර ලබාගත හැකි තැනකින් කා දඩාවතේ යන බල්ලන් වෙනුවෙන් බදු එකතු කිරීම කළ නොහැකි දෙයකි" යනුවෙනි.[17] මෙම බදු වර්ග අතරින් ජනතා අප්‍රසාදය දැඩිව නැග ආ බද්දක් වූයේ ඇඟ බද්ද හෙවත් පාර බද්ද යි. එම බද්දට අනුව වයස අවුරුදු දහ අටටත් පනස් පහටත් අතර සෑම පිරිමියෙකුම

වර්ෂයකට දින හයක් පාරෙහි වැඩ කළ යුතු බවත් එසේ නැතහොත් සිලිම් තුනක මුදලක් ගෙවිය යුතුය. 1833 ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කර දමන ලද රාජකාරි ක්‍රමය යළි බලාත්මක කිරීමක් ලෙස මිනිස්සු සිතූහ.[18] මෙම බද්දෙහි විශේෂත්වය වන්නේ ඉතිහාසයේ කිසිදු දිනක බදු සඳහා යටත් නොවූ භික්ෂූන් වහන්සේලා ද බද්දට යටත් කොට තිබීමයි. බුද්ධාගමත් භික්ෂූන් වහන්සේලාත් රැකීමට පොරොන්දු දී තිබෙන ආණ්ඩුවක මෙම යෝජනාව, බෞද්ධ ජනතාව කලකිරවීමට සමත්විය. සමස්තයක් වශයෙන් මෙම බදු සියල්ලම ජනතාවගේ දිවි පැවැත්මට බරක් වන ආකාරයේ ඒවා වූ නිසා සියලුම වැසියන් පසු වූයේ ආණ්ඩු විරෝධී මානසිකත්වයකිනි.

මෙම බදු හඳුන්වා දීම් වලට අමතරව තවත් බදු වර්ග හඳුන්වා දෙනු ඇතැයි ජනතාව අතර සැක සංකා මතුව තිබුණි. එයට ප්‍රධාන හේතුව වූයේ බ්‍රිතාන්‍ය රජය විසින් එතෙක් කල් සත්‍ය තොරතුරු ලබාගැනීමකින් තොරව සකස් කොට තිබූ සංඛ්‍යා ලේඛන වෙනුවට විධිමත් ලෙස එකතු කරන ලද සත්‍ය තොරතුරු ඇතුළත් කොට 'නිල් පොත' (Blue Book) නමින් හැඳිනවෙන දත්ත පොත නිර්මාණය කිරීම සඳහා ජනතාව අතර බෙදා තිබූ ප්‍රශ්නාවලියයි. මෙම ප්‍රශ්නාවලියට තොරතුරු එකතු කරන කාලයේම යටත් විජිත ලේකම් එමර්සන් ටෙනන්ට් මහතා පොතක් ලිවීම සඳහා කරුණු එක්රැස් කරමින් ගැහැණුන්ගේ පයෝධරවල වටප්‍රමාණය පවා මැන ගත්තේය. ඒ නිසා අනාගතයේ කන්තාවන්ගේ පයෝධරවල ප්‍රමාණය අනුව බදු ගෙවීමට සිදුවනු ඇතැයි රාවයක් ද පැතිර තිබුණි.[19] මෙමගින් පෙන්නුම් කරන්නේ මෙකල බ්‍රිතාන්‍යයන් සිදු කරන කවර ක්‍රියාවක් වුව ද බදු පැනවීමේ ආරම්භයක් යැයි සිතන තරමට ජනතාව පෙළඹී සිටි බවයි.

1815 දී බුදුදහම මූලිකත්වය දී ආරක්ෂා කිරීමටත් 1818 දී එම මූලිකත්වය ඉවත් කිරීමටත් කටයුතු කළ බ්‍රිතාන්‍යයෝ 1847 ඔක්තෝම්බර් මස පළමු වැනි දින තමන් බාරයේ පැවති දළදාව භික්ෂූන් වහන්සේ සහ දියවඩන නිළමේගෙන් යුත් කමිටුවකට බාරදුන්හ.[20] දළදා මාළිගාවට යොදා තිබූ ආරක්ෂාව ඉවත් කොට



වාර්ෂිකව එහි නඩත්තුව සඳහා ලබා දුන් ආධාර මුදල ගෙවීම ද නතරකර දැමීය. අනතුරුව භික්ෂූන් වහන්සේලාට අක්ත පත්‍ර ලබා දීම මගින් නායකකම් ආදිය ප්‍රදානය කිරීම සහ ගිහි බෞද්ධයන්ට නිලතල ලබා දීම අත්හැරි රජය බුද්ධාගමේ කටයුතු සිදුකරුගැනීම බෞද්ධයන්ටම පැවරීය. 'දළදාව හිමි පුද්ගලයන්ට ලංකාවේ රාජ්‍යත්වය දැරීමේ අයිතිය ඇත' යන සාම්ප්‍රදායික පිළිගැනීම මත ඉංග්‍රීසීන්ට තවදුරටත් පාලනය බලය දැරීමේ අයිතිය නැත යන අදහස ජනතාව අතර ප්‍රචාරය විය. මෙම ප්‍රචාරය වීම සංකල්පමය වශයෙන් ඉංග්‍රීසීන්ට එරෙහිව ජනතා නැගිටීමට අවශ්‍ය මතවාදීය ශක්තිමත් භාවය ලබා දෙන ලදී.

මේ ආකාරයට කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ඇතිකරන ලද දිගු කාලීන සමාජ විපරීතයනුත් ටොරින්ටන් සාමිවරයා විසින් පනවන ලද නව බදු ක්‍රමයන්ට එරෙහිව නැගුණු ජනතා විරෝධයත් දළදා වහන්සේ පිළිබඳ වගකීම්වලින් ඉංග්‍රීසි ආණ්ඩුව ඉවත්වීමත් යන කාරණා පදනම් කරගනිමින් බ්‍රිතාන්‍ය ආණ්ඩුවට එරෙහිව ජන අරගලයක් නිර්මාණය වීමට ගැළපෙන පසුබිමක් ලංකා භූමිය තුළ නිර්මාණය වෙමින් පැවතුණි. 1817 කාලවකවානුවේවත් මෙබඳු ජනතා විරෝධයක් පැවතියේ නැත. 1818 නිර්දය ලෙස මර්දනය කළ ජනතා නැගිටීමෙන් පසුව වසර 35 පුරාවට විවිධාකාරයෙන් අවස්ථා හයක දී බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාර හට ගැනුණත් ඒවා ඉතා පහසුවෙන් ව්‍යර්ථ කිරීමට පාලකයන්ට හැකි විය. එම අරගල අතරෙන් 1843 දී ඇති වූ අරගලය විශේෂත්වයක් ගන්නේ එයට නායකත්වය දුන් පුද්ගලයන් පහත රටින් උඩරට ප්‍රදේශයට පැමිණි පුද්ගලයන් හේතුවෙනි. 1848 අරගලයට නායකත්වය සපයන්නේ ද එම පුද්ලයන්ම බැවින් යළිත් වරක් ඒ පිළිබඳ සාකච්ඡා කළ යුතුය.

දීනිස්, ඩේවිඩ් සහ ඩිංගිරාළ යන පුද්ගලයන් බ්‍රිතාන්‍යයන් ලංකාවෙන් පලවා හැරීම සඳහා 1843 දී ජනතාව පෙළගැස්වීමේ කාර්යයේ නිරත වූහ. මහනුවරින් පිට බොහෝ දිස්ත්‍රික්කවල සංචාරය කළ මොවුන්ට එම ප්‍රදේශයන්හි සෑම පන්සලකම පාහේ නවාතැන් ලැබී තිබේ. එම පන්සල්වල වාසය කළ භික්ෂූන්

වහන්සේලා ප්‍රදේශයේ තොරතුරු සපයමින් දීනිස් ඇතුළු පිරිසට අවශ්‍ය සම්පත් දායකයන් ලෙස ක්‍රියා කළහ. 1848 නිදහස් සටනේ දී අත්අඩංගුවට ගත් දීනිස්ගේ ප්‍රකාශ වලට අනුව පැහැදිලි වන්නේ රට පුරා බොහෝ ප්‍රධානීන් සමග ඔවුන් සම්බන්ධතා ගොඩනගාගෙන තිබූ බවයි. නඩු විභාගය අවස්ථාවේ අරගලයට තවත් සම්බන්ධ වූයේ කවුරුන්දැයි නම් කරන ලෙස දීන්ස්ට නියෝග කළ අවස්ථාවේ ඔහු ප්‍රකාශ කොට අත්තේ සහයෝගය දුන් අය නම් කරනවාට වඩා සහය නොදුන් අය නම් කිරීම ඉතා පහසු බවයි. මෙයින් ප්‍රත්‍යක්ෂ වන්නේ හුදෙක්ම නව බදු පැනවීම් හෝ දළදා වහන්සේගේ අධිකාරීත්වය සිංහලයන්ට පැවරීම නිසා හෝ ජනතා නැගිටීමක් ඇති නොවූ බවයි. ජනතා නැගිටීම, 1818 සිට නොනැසී පැවති අධිරාජ්‍ය විරෝධී ආකල්පයන්හි දෙදරායාම 1848 දී සිදු වූ බවයි.

1848 දී සෘජුවම බ්‍රිතාන්‍ය ආණ්ඩුවට එරෙහිව නැගී සිටීමට පළමුව ලංකාවේ විවිධ පළාත්වල ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිවලට එරෙහිව උද්ඝෝෂණ මාලාවක් ආරම්භව තිබුණි. නව බදු සංකපල්ප ඉදිරිපත් කොට තිබුණත් තුවක්කු බද්ද හැරෙන්නට අනෙකුත් බදු ක්‍රියාත්මක භාවයට පත් කොට නොතිබුණි. එම නිසා එම බදු ගෙවීම කෙතරම් අපහසුදැයි යන්න පිළිබඳව ජනතාවට ප්‍රායෝගික අවබෝධයක් නොවීය. මෙහිදී සිදුවන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදයෙන් සිටි ජනතාව පුවත්පත් මාර්යෙන් හා රැස්වීම් මගින් දැනුවත් කොට ආණ්ඩුවට එරෙහිව පෙළගැස්වීමයි. එහි ප්‍රධානීන් ලෙස ක්‍රියා කොට ඇත්තේ ප්‍රභූ ප්‍රධානීන් සහ කලම්බු ඔබ්සර්වර් පුවත්පතයි. එම පුවතේ ප්‍රධාන කතෘ ක්‍රිස්ටෝපර් එලියට් ඇතුළු බර්ගර් ජාතිකයන් පිරිසක් කෝල්බෘක් ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීමෙන් පසුව නිල නොලත් මන්ත්‍රීන් පත්කිරීම පිළිබඳව සහ ඔවුන්ගේ බලතල පුළුල් කොට ගැනීම පිළිබඳව උද්ඝෝෂණ මෙහෙය වීය. 1848 අරගලය ආරම්භ වීමට ආසන්න සමයේ නව බදුවලට එරෙහිව ඔබ්සර්වර් පුවත්පතේ පළ වූ ලිපි සිංහලයට පරිවර්තනය කොට ජනතාව අතර බෙදා හැර තිබුණි. ඒවා කියවිය හැකි පුද්ගලයන් සීමා සහිත වුවත් පන්සල්වලට බෙදා



හරින ලද පත්‍රිකා භික්ෂූන් වහන්සේලා විසින් ජනතාවට පැහැදිලි කර දීම නිසා විශාල ජනතා පිබිදීමක් ඇති විය.

බ්‍රිතාන්‍ය විරෝධී ජනතා මතය නිර්මාණය කිරීමෙහි ලා විශාල ගෞරවයක් කලම්බු ඔබ්සර්වර් පුවත්පතටත් එහි කර්තෘ එලියට් මහතාටත් හිමි විය යුතුය. ඔහුගේ සංවිධානයෙන් 1848 ජූලි බොරැල්ලලේදී පැවැත් වූ බදු විරෝධී රැස්වීමේ දී ආණ්ඩුකාරයාට යැවූ පෙත්සමෙන් කියා සිටියේ 'ඔබ වහන්සේ අපට අනුකම්පා කොට සතුටුදායක පිළිතුරක් මෙයට ලබා නොදුනහොත් ඔබ විසින් අළුතින් පනවන ලද එකද නීතියකටවත් අපි අනුකූලතාවක් නොදක්වන්නෙමු යනුවෙනි'.[21] මෙම විරෝධතා රැල්ල රට පුරා ව්‍යාප්තව ගිය අතර ගාල්ලේ දී අලුත් බදු පිළිබඳව පැහැදිලි කිරීමට පැමිණි එමර්සන් ටෙනන්ට්ට ජනතාව විසින් ගල් ගසා එලවා දැමීය. බදුල්ලට රැස් වූ ජනතාව ආණ්ඩුවේ ඒජන්තවරයා ඉදිරි පිටදීම තුවක්කු පොළවේ ගසා කඩා දැමීය. මෙම විරෝධතා දැක්වීමේ උච්චතම සිද්ධිය වාර්තාවන්නේ මහනුවරිනි. ජූලි 08 වන දින මහනුවර කච්චේරිය අසළට රැස් වූ විශාල පිරිසක් දිසාපති සී. ආර්. බුලර් මහතා හමු වී බදු ප්‍රතිසංස්කරණ සඳහා තමන්ගේ ඇති විරෝධතාව ප්‍රකාශ කොට සිටියහ. එම අවස්ථාවේ දළදා මළිගාවේ පත්තිරිප්පුවට නැගුණු බුලර් මහතා ජනතාව ඇමතීමට උත්සාහ කළත් එය අසාර්ථක ව්‍යායාමයක් විය. ජනතාව අතර ඇති වූ නොසන්සුන්තාව පාලනය කිරීමට පොලීසිය අසමත් වූ බැවින් යුධ හමුදාව කැඳවීමට ද සිදු විය. එහිදී වැඩ බලන පොලිස් පරීක්ෂක දුණුවිල ලොකු බණ්ඩා මහතාට අසු පිටින් වැටෙන් තෙක් පහර කෑමට සිදු විය. උප පොලිස් පරීක්ෂක හා සාජන්වරයෙක් ද කොස්තාපල්වරු හය දෙනෙකුටද පොලු පහර කෑමට සිදුව තිබුණි. කර්නල් ඩ්‍රෞට් විසින් 1848.10.12 වන දින ටොරින්ටන් ආණ්ඩුකරු වෙත යැවූ ලිපියක දැක්වෙන්නේ මහනුවර මෙම මෙහෙයවීම් සිදු කර ඇත්තේ ගොන්ගාලේ ගොඩබණ්ඩා නමැත්තෙකු බවය. මෙම ජනතා විරෝධයට දවස් කීපයකට පෙර සිට මොහු නුවර ප්‍රදේශයේ ගැවසුණු බවත් කච්චේරිය අසළ

ජනතාව අතර ගැවසෙමින් ඔවුන් සංවිධානය කළ බවත් එහි දක්වා තිබේ.[22]

මේ ආකාරයට බ්‍රිතාන්‍ය පාලනය විසින් ම අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන් හේතුවෙන් ඔවුන්ට එරෙහි දැවැන්ත ජන අරගලයකට අවශ්‍ය ආකාරයේ පසුබිමක් නිර්මාණය වී තිබුණි. ඒ අනුව පෙර අරගලයන්හි දී මෙන් ම 1848 ජුලි 20 වන දින දඹුලලේ දී අරගලයේ නායකයා වශයෙන් රජතුමෙකු පත් කරගන්නා ලදී. එසේ රජකමට පත්වූයේ කැළණියේ පැලියගොඩ වනවාසල ප්‍රදේශයේ වැසියෙකු වූ ඩේවිඩ්ය. ගොන්ගාලේගොඩ බණ්ඩා යන නමින් ජනතාව අතර ප්‍රකටව සිටි ඔහු ශ්‍රී වික්‍රම සර්ව සිද්ධිය නමින් අභිෂේක කරන ලදී.[23] දඹුල්ල විහාරයේ විහාරාධිපති වූ ගිරාණගම ඉන්ද්‍රජෝති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අභිෂේක උත්සවයට ලක්ෂයක පමණ ජනකායක් සහභාගී වී තිබේ. මෙහි දී ගොන්ගාලේගොඩ බණ්ඩාගේ සහෝදර දීනිස් උප රජු වශයෙන් ද හඟුරන්කෙත ඩිංගිරාළ සත්කෝරළයේ රජු වශයෙන් ද නම් කෙරිණි. මොරටුවෙන් පැමිණි වැසියෙකු වූ ප්‍රැන්සිස්කෝ ප්‍රනාන්දු හෙවත් පුරන් අප්පු පළමුවැනි අධිකාරම් ලෙස පත්කොට තිබුණි.[24] මෙම පත්කිරීම්වලින් පැහැදිලිවම පෙනෙන්නේ 1843 බ්‍රිතාන්‍යයන්ට එරෙහිව නැගී සිටීම නිසා දඬුවම් නියම වූ පුද්ගලයන්ම 1848 දී අරගලයේ නිල ලත් නායකයන් ලෙසින් බෞතීස්ම ලබා ඇති බවයි.

මෙම අරගලයේ අධිකාරම් ධුරයට පත්ව සිටි පුරන් අප්පු 1844 දී බ්‍රිතාන්‍යයන්ට එරෙහිව කැරලි ගැසීමේ වරදට සිරදඬුවම් නියමව සිටියදී ඉන් පලාගොස් සිටි පුද්ගලයෙකි. ඔහු කඩහපොල හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා පිරිසක් සමග සංවිධානගතව බ්‍රිතාන්‍යයන්ට එරෙහිව නැගීසිටීමට සූදානම්ව සිටියේය.[25] මෙම පිරිසත් ගොන්ගාලේගොඩ බණ්ඩා ඇතුළු පිරිසත් එකතු කළ මධ්‍යස්ථානය වූයේ දඹුලු විහාරයයි. එහිදී එම පිරිස එකම සටන් පෙරමුණක් බවට පත් කරමින් පුළුල් ජනතා බලවේගයක් බවට පත් කරන්නේ ගිරාණගම හිමියන්ගේ අනුශාසනා යටතේය. 1818 දී හඟුරන්කෙත පැවැත් වූ



අභිෂේකයට රාජකීය ලේ සම්බන්ධ පරම්පරා උරුමය සෙවූ සටන් සගයන් සේම ජනතාව එයින් වසර තිහකට පමණ පසුව චින්තනමය වශයෙන් පෙරළියකට පත්ව සිටි බව දඹුලු අභිෂේකය දෙස බැලීමේ දී පැහැදිලි වේ. එබඳු චින්තනමය වශයෙන් පෙරළියක් ඇති වීමට බ්‍රිතාන්‍ය පාලනයෙන් ජනතාව අධික පීඩනයකට පත්ව සිටීම බොහෝ සෙයින් බලපාන ලද බව හඳුනාගත හැකිය. ජනතාවට අවශ්‍ය වූයේ කෙසේ හෝ බ්‍රිතාන්‍ය පාලනයට අභියෝග කළ හැකි අභීත නායකත්වයකි. ඒ අනුව පත්ව සිටි නායකයන්ට ජනතාව බලාපොරොත්තු වූ සටන්කාමී ගුණය පැවති අතර දඹුල්ල විහාරයේ නායක හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් තනතුරු පිරිනැමීමෙන් සම්ප්‍රදායානුකූල ජාතික පිළිගැනීම ලැබුණි.

මේ ආකාරයට දඹුල්ලේ පැවති උත්සවයෙන් පසුව ප්‍රසිද්ධියේම බ්‍රිතාන්‍ය පාලන බලය පෙරළා දැමීම සඳහා වන අටවන නිදහස් අරගලය නැතහොත් බ්‍රිතාන්‍යයන්ට එරෙහිව දියත් කරන ලද පුළුල් සංවිධානයක් සහිත දෙවන නිදහස් අරගලය ආරම්භ කරන ලදී. මහනුවර නගරය අත්පත් කරගැනීමේ අපේක්ෂාවෙන් දඹුල්ලේ සිට ඉදිරියට පැමිණි සටන්කාමීහු ජුලි 28 වන දින මාතලේ නගරය සම්පූර්ණයෙන් ම අත්පත් කරගත්හ. ජුලි 29 වන දින ඩිංගිරාළගේ නායක්වයෙන් යුත් 5000ක පමණ පිරිසක් කුරුණෑගල නගරයට පහර දී සුදු ජාතිකයන්ගේ දේපොළ මංකොල්ල කෑමටත් ගිනිබත් කිරීමටත් සමත් වූහ. මහනුවර නගරය ආක්‍රමණය කිරීම සඳහා පිරිස්වලට කටුගස්තොටින් ඔබ්බට යාගත නොහැකි විය. මෙම ජනතා නැගිටීම පාලනය කිරීම සඳහා ටොරින්ටන් සාමිවරයා ඉන්දියාවෙන් හමුදාව කැඳවූ අතර ජුනි 29 වන දින යුධ නීතිය ද පැනවීය. එනිසා අභිනව රජු මහනුවරට ඇතුළු වූ වහාම ඔහුට එකතුවීමේ අපේක්ෂවෙන් ආයුධ සන්නද්ධව එක්රොක් වෙමින් සිටි ඌව වෙල්ලස්ස ප්‍රදේශය ඇතුළු විවිධ ප්‍රදේශවල ජනයාට එම අවස්තාව මගහැරී ගියේය. මේ අතරතුර රාජ්‍යත්වයේ සංකේතය වශයෙන් සැලකූ දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂාව සඳහා කොළඹට රැගෙන ගියේය.

1848 ජුලි 28 වන දින සන්නද්ධමය අරගලයක් ලෙස ඇරඹි බ්‍රිතාන්‍ය විරෝධී අරගලය එයින් දින හතරකට පසු මර්දනය කර දැමීමට බ්‍රිතාන්‍යයෝ සමත් වූහ. වැඩි දිනක් ගතවීමට මත්තෙන් අරගලයට සම්බන්ධ සියලුම ප්‍රධාන නායකයන් අත් අත්අඩංගුවට ගෙන සැප්තැම්බර් මාසය වන විට තඩු අසා දඬුවම් ද නියම කොට අවසන් කෙරිණි. 1818 අරගලය තරම් ව්‍යාප්ත වීම හෝ කාලය ගත වීමක් සිදු නොවූවත් ටොරින්ටන් සමිවරයා විසින් දියත් කරන ලද මර්දන ව්‍යාපාරය ඉතා වේගවත් විය. කැරලි කරුවන් ලෙස සැක කරනු ලැබූ 200 පමණ මරණ දඬුවමට යටත් කෙරිණි. අග්‍ර විනිශ්චයකාර ඇන්තනි ඔලිෆන්ට් ආණ්ඩුකාර ටොරින්ටන්ට මෙසේ ලියා යැවීය. 'කිසියම් යුරෝපීයෙකු මරා නොදැමුණු බවත් කැරලිකරුවන් විසින් තුවාල කරනු ලැබූ සොල්දාදුවන්ගේ ගණන හුදු එකකට සීමා වීමත් මාතලේ සහ කුරුණෑගල සිදු වූ අරගලයනට පසුව හමුදාවට විරුද්ධව කිසිවෙකු රණ වෙසින් නො එළඹුණු බවත් සලකන විට නීතියේ බලය රැකගැනීමට වේවා ආදර්ශයක් පිණිස වේවා මෙතෙක් සොලවන ලද ලේ ප්‍රමාණය හැම අතින්ම සෑහෙයි.' කැරලිකරුවකු ඇල්ලීමට උපකාර විය හැකි ආරංචියක් වසන් කිරීම සම්බන්ධයෙන් කුඩාපොළ උන්නාන්සේ නමැති භික්ෂුවක් යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවන ලදී. මේ අපූර්ව චෝදනාව උඩ ඒ නම වෙඩි තබා මරණ ලෙස අණක් නිකුත් කැරිණි. සිරකරුවා හට විරුද්ධව ඉදිරිපත් කෙරුණු සාක්ෂ්‍ය මරණීය දණ්ඩනයකට තබා ඔහු හුදු වරද කරුවෙකු කිරීමටවත් තරම් නොවූ බව සැලකූ රජයේ අධි නීතිඥ එච්. සී. සෙල්බි මහතා ඒ දඬුවම නොපමුණුවන ලෙස ඉල්ලා සිටියේය. එහෙත් ටොරින්ටන් සාමි ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ දරුණු වාක් මාලාවකිනි. භික්ෂුව කාසාය වස්ත්‍රය පිටත් ම වෙඩි තබා මරණ ලදී. මේ සාහසික ක්‍රියාවන් නිසා ජනිත වූ කෝපය අති මහත් වී වෙන එකද මිනිසෙකු වෙඩි තබා මැරුවහොත් තමා සිය සේවයෙන් ඉල්ලා අස්වන බවට අග්‍ර විනිශ්චයකාරවරයා තර්ජනය කළ බවක් ද වාර්තා වේ.[26] මේ ආකාරයට සිදු කරන ලද මර්දන ව්‍යාපාරය හේතුවෙන් 1848න් පසු බ්‍රිතාන්‍යන්ගෙන්



නිදහස ලබගන්නා තෙක්ම කිසිදු අවිගත් අරගලයක් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහිව මතු නොවීය.

කෙසේ නමුත් මෙම අරගලය මර්දනය කිරීමට අනුගමනය කළ ක්‍රියා පටිපාටිය පිළිබඳව මෙරටින් මතු වූ විරෝධාවන්ට පිළිතුරු මතු වූයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙනි. ඒ අනුව අරගලය ඇතිවීමට හේතු සහ එය මර්දනය කළ ආකාරය පිළිබඳව සොයා බැලීමට විශේෂ කොමිෂන් සභාවක් පත් කළේය.[27] එම කමිටුවේ පරීක්ෂණ නිගමනය වී ඇත්තේ අරගලය මර්දනය කිරීමට ටොරින්ටන් සාමිවරයා අනුගමනය කළ ක්‍රියා පිළිවෙතෙහි වරදක් නොමැති බවත් එම ක්‍රියාමාර්ග නිසා අරගලය ඉකිමනින් මර්දනය කිරීමට හැකි වී ඇති බවයි. එහෙත් ටොරින්ටන් ආණ්ඩුකාරයා සහ රජයේ ඉහළ නිළධාරීන් අතර යම් මතභේද සහ විරෝධතා පවතින බව හෙළි වන නිසා රටේ යහපාලනයට එම තත්ත්වය බාධාවක් විය හැකි බැවින් ආණ්ඩුවේ අවධානය එය වෙත යොමු කළයුතු බව කමිටුව නිර්දේශ කොට ඇත. ඒ අනුව 1850 නොවැම්බර් මාසයේ ටොරින්ටන් ආණ්ඩුකාරයා සහ යටත් විජිත ලේකම් එමර්සන් ටෙනන්ට් ආපසු එංගලන්තයට කැදවීය. මේ මත පදනම් වන මාලනී ඇදගම මහත්මිය පෙන්වා දෙන්නේ මෙතෙක් ලංකාවේ ඉතිහාසය ඉගෙනීමේ දී ප්‍රචලිතව පිළිගෙන තිබෙන මතයක් වන 1848 අරගලය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද වැරදි ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම නිලධාරීන් දෙදෙනා යළි කැදවන ලදැයි යන මතය සාවද්‍ය බවයි.[28] කමිටු වාර්තාවෙන් මතුකෙරෙන ඉතා වැදගත් කරුණක් වන්නේ 1848 සටන මංකොල්ලකරුවන්ගේ කලබලයක් නොව එය අධිරාජ්‍යවාදී බ්‍රිතාන්‍ය පාලකයන් ශ්‍රී ලංකාවෙන් පළවා හැර නිදහස ලබා ගැනීම සඳහා 1817 සිට ගෙනගිය සටනේ උච්චතම අවස්ථාවක් බව ද ජනප්‍රධානීන්ගේ සහ භික්ෂූන් වහන්සේගේ මෙහෙය වීම යටතේ සිදුවූ එම සටනේ එකම අරමුණ වූයේ ආයුධ සන්නද්ධ සටනක් මගින් බ්‍රිතාන්‍යයන් පලවා හැරීම බව ද පිළිගෙන තිබීමයි.[29]

25 MAY 2022

අරගලයේ ප්‍රතිඵල වශයෙන් සැලකිය හැකි පාලන ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට පාලකයන්ට සිදු විය. විරෝධයට තුඩුදුන් බදු වර්ග අතරින් වෙළඳ බද්ද[30] සහ බලු බද්ද[31] සම්පූර්ණයෙන්ම අවලංගු කරන ලද අතර අනෙකුත් සියලු බදු වර්ග සංශෝධනය කරන ලදී. විශේෂයෙන්ම භික්ෂූන්වහන්සේලාට පනවා තිබූ ඇග බද්ද ඉවත් කළේය. 1815 ගිවිසුමේ වගන්ති ප්‍රකාරව බුද්ධාගමට ප්‍රමුඛතාව සහ ආරක්ෂාව ලබා දිය යුතු බව පිළිගත් ආණ්ඩුව දළදා වහන්සේගේ භාරකාරත්වය නැවතත් ආණ්ඩුව යටතට ගනිමින් දළදා මාළිගාව වටා යුධ භටයන් යොදවමින් ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත්තේය. ටොරින්ටන් සාමිගෙන් පසු ආණ්ඩුකාර ධූරයට පත් වූ ඇන්ඩර්සන් සාමි එතෙක් අතහැර දමා තිබූ රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කරගෙන පැමිණි බෞද්ධාගමික ගිහි පැවිදි තනතුරු ප්‍රදානය කිරීම නැවත ආරම්භ කළේය.[32] සටන් කිරීමෙන් බ්‍රිතාන්‍යයන් රටින් පන්නා දැමීමට නොහැකි වුවත් බලෙන් පැටවීමට ගිය බදු ජනතා හිතවාදී ලෙස සංස්කරණය කරගැනීමටත් ආගමික වශයෙන් බුද්ධාගමේ අයිතිවාසිකම් දිනාගැනීමටත් හැකි විය.

උපක්‍රමශීලීව 1815 දී දිනාගන්නා ලද උඩරට 1818 දී අවි බලයෙන් තම බලය හවුරු කර ගැනීමට බ්‍රිතාන්‍යයෝ සමත් වූහ. එතැන් පටන් බ්‍රිතාන්‍යයන් ලංකාව පුරා ක්‍රියාත්මක කරන ලද්දේ තමන්ට අභිමත පාලන ක්‍රමයකි. එහෙත් එකී පාලන ක්‍රමයට අභියෝග කරමින් ලාංකිකයන් විසින් සටන් ක්‍රියාමාර්ග අටක් පමණ සැලසුම් කොට තිබේ. එම අරගල අතරින් ප්‍රබලව සක්‍රිය තත්ත්වයට පත්කිරීමට හැකි වූයේ 1817-18 අරගලය සහ 1848 අරගලය පමණි. එයින් 1818 අරගලයේ භික්ෂුවගේ මැදිහත් වීම ප්‍රමුඛව මතු වී පෙනෙන අතර 1848 අරගලයේ නැගී සිටින ප්‍රධාන භික්ෂු චරිත යුගලය වන්නේ කඩහපොල හිමියන් සහ දඹුල්ල විහාරාධිපති ගිරාණගම හිමියන් පමණි. එම අරගලයේ දී ඩේවිඩ්, දීනිස් ඇතුළු පිරිස අරගලය සංවිධාය කිරිමට රට පුරා ඇවිද යද්දී සැම පන්සලකම සිටි භික්ෂූන් වහන්සේලාගෙන් නවාතැන් දීමෙන් හා තොතුරු ලබා දීමෙන් අනගි සහයක් වූ බව



ගොන්ගාලේගොඩ බණ්ඩාගේ තොරතුරු දැක්වීම් තුළ සඳහන් වී තිබේ. එපමණක්ම නොවේ ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තියට එරෙහිව ජනතාව පෙළගැස්වීමේ දී කළඹු ඔබ්සර්වර් පුවත්පතේ පරිවර්තන ලිපි ජනතාවට පැහැදිලි කර දෙමින් විශාල සේවාවක් භික්ෂූන්වහන්සේලා ඉටු කළහ. මේ අනුව තත්කාලීන යුගයේ ජාතික වශයෙන් ස්වාධීනත්වය දිනාගැනීම උදෙසා භික්ෂුව ද මැදිහත්ව ඇති බව හඳුනා ගත හැකිය.

## ආන්තික සටහන්

1 මාලනී ඇඳගම, (2014) "යටත් විජිතවාදයේ ව්‍යාප්තිය සහ ස්වදේශීය ප්‍රතික්‍රියා', ශ්‍රී ලාංකේය ඉතිහාසය - වෙළුම IV. (සංස්.) ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග, කොළඹ: ගුණසේන, පි. 131-134.

2 තෙන්නකෝන් විමලානන්ද, (2006) උඩරට මහ කැරැල්ල - 3 කාණ්ඩය, කොළඹ: ගුණසේන. පි. 90-105.

3 Colvin R. De Silva, (1953) Ceylon under the British Occupation 1795-1833 Vol-ii, Colombo: Apothecaries Co.Ltd, 207-212p.

4 The Colebrooke-Cameron Papers, Documents on British Colonial policy on Ceylon; 1796-1833 in Two Volumes, (1995) (ed.) G.C. Mendis, London: Oxford University Press, XXXI-XXXIII; K.M. De Silva, University of Ceylon; History of Srilanka from C1500 to C1800 Vol-ii, University of Peradeniya, 264p.

5 ඩබ්ලිව්. ඒ. විමලරත්න, (1984), "1848 කැරැල්ලේ ස්වරූපය", ඓතිහාසික මාතලේ, මාතලේ: මාතලේ දිසා සංස්කෘතික මධ්‍යස්ථානය, පි. 266.

6 එම, පි. 64-75.

7 D.C. Vijevaradhana, (1953), The Revolt in the Temple, Colombo: Sinha Publication. 105p.

8 Herbet White, (1983), Manual of the Province Uva, Colombo: Government Press. 67-69p.

9 B.H. Farmer, (1957), Poineer Peasant Colonization of Ceylon , London: Oxford University Press. 17p.

10 John Davy, (1821), An Acount of the Interior of Ceylon and it's Inhabitants, London: Longmans. 331p.

11 Major Skinner, (1891), Fifty Years in Ceylon, London: W.H. Allen and Co.Limited. 165-167p.

12 Wotson, Observation upon the Rebellion Ceylon 1848, 184p.

13 A Collection of Legislative Acts of Ceylon govt. Vol-ii, 346-350p.

14 G.C. Mendis, (1956), Colebrook Cameron Papers Vol-i, oxford university press. 127p.

15 G.C. Mendis, 05p.

16 Wotson, 03p.

17 E.F.C. Ludowyk, (1962), The Story of Ceylon, London: Faber and Faber. 249p.

18 Wotson, 06-07p.

19 Ibid, 08p.

20 Henry Charles Sirr, (1850), Ceylon and the Cingalese Vol-i-ii, London: William Shoberl Publisher. 341p.

21 Wotson, 13p.

22 විමලරත්න, පි. 47.

23 Blue Book 1949 (1949), Colombo: Ceylon Government press. 190p.

24 J. Forbs, (1850), Rescent Disturbances and Military Execution in Ceylon, London: William Blackwood. 18p.

25 ඇදගම, පි. 146.

26 එස්. ජී. පෙරේරා පියතුමා, (1960), ලංකා ඉතිහාසය: බ්‍රිතාන්‍ය හා නිදහස් යුගය 1796-1956, (පරි.) ප. බ. ජී. හේවාවසම්, කොළඹ: යුනයිටඩ් නිව්ස්පේපර් සිලෝන් ලිමිටඩ්, පි. 139.

27 Sir Charles Jeffries, (1962), Ceylon, London: Pall Mall. 28p.

28 ඇදගම, පි. 148-149.

29 ඇදගම, පි. 148-149.

30 A Collection of Legeslative Acts of the Ceylon govt., Vol-ii, 386p.

31 Wotson, 265p.

32 බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ වාර්තාව, (2006), බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන. පි. 112.